# ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
# මාධ්‍ය නිවේදනය !

**අයහපත් කාලගුණික තත්වය නිසා දුම්රිය මාර්ගයට ඇතිවූ අවධානම් තත්වය නිසා ප්‍රධාන මාර්ගයේ රඹුක්කන - පේරාදෙණිය අතර 2025/10/22 දින දුම්රිය ධාවනය සීමා කිරීම හා 2025/10/23 දින නැවත ධාවනය ආරම්භ කිරීම.**

2025/10/19 දින සවස් කාලයේ පැවති අයහපත් කාලගුණ තත්වය නිසා ඇද හැලුන දැඩි වර්ෂාව හේතුවෙන් ඉහළ මාර්ගයේ කඩිගමුව - ඉහළකෝට්ටේ අතර ස්ථාන දෙකකින්(02) සහ ඉහළකෝට්ටේ - බලන අතර ස්ථාන අටකින්(08) දුම්රිය මාර්ගය දෙපස භූමිය සෝදා යාමට හා නාය යෑමට ලක්වන ලදී.

හානි වූ ස්ථාන දහයෙන් ස්ථාන අටක් යථාවත් කර ඇති අතර තවදුරටත් ඉහළකෝට්ටේ - බලන අතර ස්ථාන දෙකක් පමණක් මේ වනවිට යථාවත් කරමින් පවතී. දුම්රිය මාර්ගයට යටින් පස් සෝදාගෙන යාම, අනෙක් සියලුම ස්ථාන යථාවත් කිරීමෙන් පසු දුම්රිය මාර්ගයේ නඩත්තු කටයතු සඳහා අවශ්‍ය දුම්රියන් රැගෙන යාමට සහ තවදුරටත් පවතින අයහපත් කාලගුණය යන හේතූන් මත මෙම ස්ථාන දෙක යථාවත් කිරීමට ප්‍රමාද වී ඇත.

ඉහත හේතූන් නිසා 2025/10/22 දින සම්පූර්ණයෙන් පහත පරිදි මගී දුම්රියයන් අවලංගු කිරීමට කටයුතු කර ඇති අතර 2025/10/23 වන දින උදෑසන සිට නැවත ධාවනය ආරම්භ කිරීමට කටයුතු කර ඇත.

| දිනය | දුම්රිය අංකය | ආරම්භක වෙලාව | ආරම්භ කරන ස්ථානය | |
|---|---|---|---|---|
| 2025/10/22 | 1511 | 01.30 am | මහනුවර /පොල්ගහවෙල | සම්පූර්ණයෙන් අවලංගු කර ඇත |
| | 1038 | 04.30 am | මහනුවර /කොළඹකොටුව | |
| | 1040 | 05.00 am | මහනුවර /කොළඹකොටුව | |
| | 1034 | 05.45 am | මහනුවර /කොළඹකොටුව | |
| | 1030 | 06.15 am | මහනුවර /කොළඹකොටුව | |
| | 1036 | 06.20 am | මහනුවර /කොළඹකොටුව | |
| | 1544 | 02.20 pm | මහනුවර / පොල්ගහවෙල | |
| | 1010 | 03.00 pm | මහනුවර /කොළඹකොටුව | |
| | 1020 | 03.25 pm | මහනුවර /කොළඹකොටුව | |
| | 1583 | 05.30 pm | මහනුවර /පොල්ගහවෙල | |
| | 1587 | 09.25 pm | මහනුවර /රඹුක්කන | |
| | 1120 | 04.00 am | පොල්ගහවෙල/මහනුවර | |
| | 1128 | 05.30 am | පොල්ගහවෙල/මහනුවර | |
| | 1009 | 07.00 am | කොළඹකොටුව/මහනුවර | |
| | 1019 | 10.30 am | කොළඹකොටුව/මහනුවර | |
| | 1029 | 03.35 pm | කොළඹකොටුව/මහනුවර | |
| | 1035 | 04.35 pm | කොළඹකොටුව/මහනුවර | සම්පූර්ණයෙන් අවලංගු කර ඇත |
| | 1037 | 05.15 pm | කොළඹකොටුව/මහනුවර | |
| | 1039 | 05.55 pm | කොළඹකොටුව/මහනුවර | |
| | 1046 | 06.30 pm | බදුල්ල/ කොළඹකොටුව | |
| | 1045 | 08.30 pm | කොළඹකොටුව/බදුල්ල | |
| | 1005 | 05.55 am | කොළඹකොටුව/බදුල්ල | කොළඹකොටුව /පේරාදෙණිය අතර පමණක් අවලංගු වේ. |
| | 1015 | 08.30 am | කොළඹකොටුව/බදුල්ල | |
| | 1007 | 09.45 am | කොළඹකොටුව/බදුල්ල | |
| | 1023 | 12.45 pm | කොළඹකොටුව/නානුඔය | |
| | 1024 | 06.00 am | නානුඔය/ කොළඹකොටුව | පේරාදෙණිය/කොළඹකොටුව අතර පමණක් අවලංගු වේ. |
| | 1016 | 05.50 am | බදුල්ල/කොළඹකොටුව | |
| | 1006 | 08.50 am | බදුල්ල/කොළඹකොටුව | |
| | 1008 | 10.20 am | බදුල්ල/කොළඹකොටුව | |

# ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
# මාධ්‍ය නිවේදනය !

ඉහත දුම්රියන් වලට අමතරව 2025/10/23 වන දින කොළඹ කොටුවෙන් උදෑසන 07.00 ට මහනුවර දක්වා ධාවනය වන නගරාන්තර දුම්රියද ධාවනය නොවේ.

---

මගීන්ගේ පහසුව සඳහා අමතර දුම්රියන් යොදවා ඇත.

- 2025/10/22 දින දුම්රිය දෙකක් කොළඹ කොටුවෙන් ප.ව.04.35 ට සහ ප.ව.05.55 ට රඹුක්කන දක්වා ධාවනය කෙරේ.
- 2025/10/23 දින පොල්ගහවෙල දුම්රිය ස්ථානයෙන් පෙ.ව. 06.00 ට කොළඹ කොටුව දක්වා දුම්රියක් ධාවනය කෙරේ.

2025/10/23 දින උදෑසන මහනුවර සිට කොළඹ කොටුව බලා සහ කොළඹ කොටුව සිට මහනුවර දක්වා ධාවනය වන දුම්රියයන් පහත පරිදි ධාවනය වේ. එමෙන්ම උඩරට මැණිකේ(1015) සහ අංක 1007 දුම්රියන් හෙට දින පමණක් (2025/10/23) මහනුවරින් ගමන් ආරම්භ කෙරේ.
ඉන්පසු සාමාන්‍ය පරිදි ඉහළ මාර්ගයේ දුම්රිය ධාවනය වේ.

| දුම්රිය අංකය | ආරම්භ කරන වෙලාව |
|---|---|
| 1038 (මහනුවර සිට කොළඹකොටුව) | 04.30 am |
| 1040 (මහනුවර සිට කොළඹකොටුව) | 05.00 am |
| 1030 (මහනුවර සිට කොළඹකොටුව) | 06.15 am |
| 1005 (කොළඹ කොටුව සිට බදුල්ල) | 05.55 am |
| 1015 (මහනුවර සිට බදුල්ල ) | 11.15 am |
| 1007 (මහනුවර සිට බදුල්ල ) | 12.35 pm |

අවලංගු වූ දුම්රියන් වල රඹුක්කන - පේරාදෙණිය කොට්ඨාශය ඇතුලත්වන ලෙස මුදලට ආසන වෙන්කරවාගෙන ඇති මගීන්ගේ එම මුදල් ආසන වෙන්කරවා ගැනීමේ පහසුකම ඇති ඕනෑම දුම්රිය ස්ථානයකින් ලබා ගැනීමට පහසුකම සලසා ඇත.

දුම්රිය අවලංගු වීම නිසා මගීන්ට ඇතිවන අපහසුතාවය සම්බන්ධව දුම්රිය දෙපාර්තමේන්තුවේ කණගාටුව ප්‍රකාශ කරමු.

**ජී.ඩී.ඒ. සමරසිංහ**
**අධිකාරී (ගමනාගමන),**
**දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.**

